*9 වන ශ්‍රේණියේ 6 වන පාඩමට අදාළ ව මෙම රචනාව සකසමි.

## මගේ රට මට අගෙයි

අහසින් වැටෙන ජලය බිඳකුදු ගොවිතැන් කරන කුඹුරු වෙත නොයවා , අපතේ යාමට ඉඩ නොහරින බවට එදා මහපැරකුම් රජු කළ ප්‍රතිඥාව , එතුමා කළ මහා පරාක්‍රම සමුද්‍රය , ඒ සමුදුර පුරවා ලූ දස දෙසින් ගලනා මහ ගංගා කියා පාන්නේ මගේ රටේ සාඩම්බරයට හේතු වූ ප්‍රෞඪ මනුෂ්‍යත්වය , වස්තූන් හා සොබා දහමයි. ලෝ වැසි සැමගේ මන නුවන් බඳනා ඉන්දි සයුරේ මුතු කැටක් වන් මගේ ලක් මැණිය මට අගෙයි.

සමකාසන්න ව පිහිටීම හා සොබා දමේ මාහැඟි දායාද ඇය සතු වේ. මේවා ඇගේ රූසිරි වඩවයි. සෘතු විපර්යාසයන් නිසා විවිධ රටවල් බොහෝ කල් එක ම දේශගුණික බලපෑමකට ගොදුරු වේ. ඒ නිසා ඔවුහු සත් සමුදුරු තරණය කරති. එනමුත් මගේ පින්වත් ලක් මව මා පීඩාවට පත් නොකරයි. පැය දෙකක් තුළ දී මා කැමති දේශගුණය කරා ඈ මා රැගෙන යයි.

සමනොල ගිරි හිසින් ඇරඹෙන මහා ගංගා තවත් බොහෝ ගංගා සමගින් මට ජීවය සපයයි. සරුසාර කුඹුරු , සොඳුරු මල් ගොමු , නීල කෙත් වතු මවමින් මගේ අනේක විද අවැසි සපුරාලන්නේ ඔබයි. රට වට සහ රට තුළ ඇති ජල සම්පත , මත්ස්‍ය සම්පත ලබා දෙනවා සේ ම ධන නිධානයකි. සයුර වෙත ගලන මහා ජල කඳන් තුළ ඔබ මිණි කැට සඟවන්නේ මා වෙනුවෙන් බව මම දනිමි.

පෙර රජ දවස මගේ රට සහලින් ස්වයංපෝෂිත වූයේ ය. රජවරුන් කළ වැව් ඔබ තුළ තිත්වලින් ලකුණු කළහොත් රජරට තිත්වලින් වැසී යන්නේ ය. එදා ඔබ කුසින් ජනිත වූ වීර දූ පුතුන් ,දස මහා යෝධයින් අදටත් ජීවමාන ය. රටේ නොනවතින සංවර්ධනය සිදු කෙරෙන්නේ ඔවුනතිනි.

බුදු රදුන් තෙවරක් ම වැඩමවා , අනුබුදු මිහිදු හිමි සදහම් මී පොවා ඔබේ දූපුතුන් බොදු මගෙහි යවා ඇත. එනිසා අපි ජාති, කුල , ආගම් භේද නොහඳුනමු. සහජීවනය ,සාමකාමීබව මට පමණක් නොව ලොවට ම කියා දුන්නේ ඔබයි. කලා වැවේ දිය රැලි සේ ලෙළ දෙන අවුකන පිළිමේ සිවුරේ රැලිත් මහා කරුණා බුදු ගුණ , සමාධි පිළිමෙන් වෑහුනේත් ඔබ ඇකයේ නැලවුණු දූපුතුන්ගේ නිවී සැනසුණු සිතුවිල්ලෙනි.

මා නිරතුරු සිප්සතරින් , සරු දහමින් පෝෂණය කරන්නේ ඔබයි. කවදා හෝ ඔබ සනසන විසල් තුරකට පොහොර කරමි මගේ කය. අවසන් සුසුමෙන් ඔබෙ විඩා දුරලමි. කෘතගුණ සලකමින් ඔබට ම සේවයක් කිරීමට මම යහපත් පුරවැසියෙක් වෙමි. රට හැර නොයා සැමදා ඔබ රකිමි. තොටිල්ලේ සිට මරණ මොහොත දක්වා මගේ පණ නල සුරකින ඔබට මා ණයගැතියි.

මිහිරියි හැමෝට ම

සිරි ලංකා කියන නම

මෙ මාගේ මවු බිම

වඳිමි සැලකිලි කරමි නිතර ම